# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**4,5 ශ්‍රේණි සඳහා**
**පරිසරය**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන්නේ,

(1) වොලිබෝල් (2) දැල්පන්දු (3) අත්පන්දු

(02) ප්‍රෝටීන් බහුල ආහාරයක් නොවන්නේ,

(1) බිත්තර (2) මස් (3) බත්

(03) පෘෂ්ටයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද සහිත සතෙකි.

(1) කැරපොත්තා (2) හූනා (3) කටුස්සා

(04) මේ අතුරින් ශාක භක්ෂක සත්ත්ව කාණ්ඩයට අයත් වන්නේ,

(1) කපුටා - ගවයා (2) බත්කූරා - ගිරවා (3) එළුවා - හාවා

(05) අපේ රටට ආවේණික වූ පක්ෂියෙක් වන්නේ,

(1) හබන් කුකුළා (2) මාල ගිරවා (3) පිළිහුඩුවා

(06) හාවාගේ ගමන් විලාසය කියැවෙන වන්නම වන්නේ,

(1) තුරඟා වන්නම (2) මුසලඩි වන්නම (3) ගජගා වන්නම

(07) විටමින් 'A' අඩුවීමෙන් ඇතිවන තත්ත්වයකි.

(1) ඇස් පෙනීම දුර්වල වීම. (2) බර අඩු වීම. (3) අස්ථි දුර්වල වීම.

(08) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(1) නිල් මානෙල් (2) මානෙල් (3) සුදු නෙළුම්

(09) තෛපොංගල් උත්සවය සමරනු ලබන ආගමිකයන් වන්නේ,

(1) බෞද්ධ (2) ඉස්ලාම් (3) හින්දු

(10) ශ්‍රී ලංකාවේ ජාතික කොඩියට අයත් නොවන්නේ,

(1) අසිපත රැගත් සිංහ රුව (2) පුන්කලස (3) බෝපත්

(11) කාලයකට පමණක් පිපෙන මල් වර්ගයකි.

(1) එරබදු (2) දාස් (3) වද

(12) සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපතක් නොවන්නේ,

(1) මල්වල පරාගනය. (2) ශාක කොටස් කා දැමීම. (3) බීජවල ව්‍යාප්තිය.

(13) පාද දහයක් ඇති සතෙකි.

(1) දළඹුවා (2) මීමැස්සා (3) ඉස්සා

(14) වැලි යට දමා කල් තබා ගත හැකි ආහාරයක් වන්නේ,

(1) දෙහි (2) දෙල් (3) බිලිං

(15) මේ අතරින් අනාරක්ෂිත ස්ථානයක් වන්නේ,

(1) දුම්රිය මාර්ගයේ ගමන් කිරීම.
(2) නාය යන ස්ථානයක්.
(3) රතිඤ්ඤා පත්තු කිරීම.

(16) මේවා අතුරින් සුළඟ මගින් බීජ ව්‍යාප්තිය සිදු වන්නේ,

(1) පුවක් (2) තුත්තිරි (3) වරා

(17) ජාතික කොඩියේ කොළ පාට හා තැඹිලි පාට තීරුවලින් සංකේතවත් වන්නේ,
(1) ජාතීන්ගේ එකමුතු බව.
(2) දමිළ, මුස්ලිම් හා අනෙකුත් ජාතීන් නියෝජනය.
(3) ජාතියේ අභිමානය.

(18) බීජ ව්‍යාප්තිය සඳහා උදවුවන සතෙකි.

(1) කපුටා (2) වවුලා (3) උකුස්සා

(19) ශාකයක් ජලය උරා ගන්නේ,

(1) මුල් මගින් ය. (2) කොළ මගින් ය. (3) අතු මගින් ය.

(20) 'රන් දැකැති ගෙන නිති සැරසෙනවා...' යන කවිය,

(1) කුලු නැටුමේ කවියකි. (2) රබන් පදයකි. (3) ගොයම් නෙලීමේ කවියකි.

(21) ශාක පත්‍රවලින් කූඩු තනා ගන්නා සතෙකි.

(1) ගිරවා (2) බට්ටිච්චා (3) බකමූණා


(22) පහත ප්‍රකාශ හරි නම් '✓' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.

(1) බෙලිමල් පානයක් ලෙස සකසා ගනී. ( )
(2) ජාතික කොඩියේ රතු පැහැති පසුබිම ජාතික අභිමානය සංකේතවත් කරයි. ( )
(3) දළඹුවන් ශාක පත්‍ර කා දමන්නේ නැත. ( )
(4) ගැඩවිලා පාද නැති සතෙකි. ( )
(5) රත්නපුරය මැණික්වලට ප්‍රසිද්ධ නගරයකි. ( )

(23) ගැළපෙන සේ යා කරන්න.

| | |
|---|---|
| (1) අනවශ්‍ය ලෙස ගස් කැපීම. | (A) කළුගල් කඩන්නා |
| (2) සතුන්ගෙන් ශාකවලට ලැබෙන වාසියකි. | (B) මිනිසා පරිසරයට කරන හානියකි. |
| (3) ගල් කටුව | (C) ආරක්ෂා කිරීම අපගේ යුතුකමකි. |
| (4) පොදු ස්ථාන | (D) මදුරුවන් මගින් බෝවේ. |
| (5) ඩෙංගු | (E) පරාගනය සඳහා උදවු වීම. |

(24) රාජ්‍ය ලාංඡනයේ ඊතල මගින් පෙන්වා ඇති දේවල් නිවැරදිව හිස් තැන් මත ලියන්න.




A - ............................................................
B - ............................................................
C - ............................................................
D - ............................................................
E - ............................................................
F - ............................................................

(25) පහත කොටුව තුළ දක්වා ඇති උත්සව සමරන ආගම අනුව නිවැරදිව තෝරා වගුව තුළ ලියන්න

වෙසක් / මහා ශිව රාත්‍රී / හජ්ජි / රාමසාන් / අළු බදාදා / දීපවාලී / පොසොන් / පාස්කු

| බෞද්ධ | හින්දු | ඉස්ලාම් | ක්‍රිස්තියානි |
|---|---|---|---|
| .................................. | .................................. | .................................. | .................................. |
| .................................. | .................................. | .................................. | .................................. |